# ණයවර කාඩ්පත් හිමියා හා හැටන් නැෂනල් බැංකුව (පීඑල්සී) අතර ණයවර කාඩ්පත් ගිවිසුම (PQ 82)

## 1. අර්ථකථනය

මෙම කොන්දේසි තුළ ගිවිසුම විසින් එලෙස ඉල්ලා සිටින හෝ එකඟ වන අවස්ථාවන්හිදී 'මෙම ගිවිසුම' යන්නෙන් අදහස් වන්නේ බැංකුව හා කාඩ්පත්හිමියා අතර ඇති ගිවිසුම වන අතර මෙම කොන්දේසි වගන්ති වරින් වර සංශෝධනය විය හැකියි. 'කාඩ්පත' යනු හැටන් නැෂනල් බැංකුව විසින් සිය ප්‍රාථමික හා පරිපූරක කාඩ්පත් දරන්නන් වෙත නිකුත් කරන ලද සියලුම ණයවරපත් වේ. 'ප්‍රාථමික කාඩ්පත් දරන්නා' යනු පවත්වාගෙන යනු ලබන කාඩ්පත් ගිණුමක සිය නම සඳහන් අයෙකු, ඔහුගේ/ඇයගේ උරුමකරුවන්, පැවරුම්ලත් බලකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් වේ. 'පරිපූරක කාඩ්පත් දරන්නා; යනු ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ නාමිකයෙක් වන කාඩ්පත් ගණුදෙනු කිරීමට අවසර ලත් අයෙක් සහ ඔහුගේ /ඇයගේ උරුමකරුවන්, පැවරුම්ලත් බලකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් වේ. 'බැංකුව' යනු හැටන් නැෂනල් බැංකුව, එහි පැවරුම්කරුවන් සහ අනුප්‍රාප්තිකයන් වේ. 'කාඩ්පත් ගිණුම' යනු කාඩ්පත් ගණුදෙනු වලට අදාළව කාඩ්පත් මධ්‍යස්ථානය තුළ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක් වේ. 'කාඩ්පත් මධ්‍යස්ථානය' යනු අංක 479, ටී.බී.ජයා මාවත, කොළඹ 10 ලිපිනයෙහි හෝ දැනුම් දෙන ලද හෝ වෙබ් අඩවියේ පළ කරන ලද වෙනත් ස්ථානයක පිහිටා ඇති හැටන් නැෂනල් බැංකුවේ ණයවරපත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කාර්යාලය වේ. 'කාඩ්පත් දරන්නා' යනු මෙම ගිවිසුමට යටත්ව කළ කාඩ්පතක් භාවිතා කරනු ලබන අයෙක් වන අතර ඊට ප්‍රාථමික කාඩ්පත් දරන්නා සහ ප්‍රතිපූරක කාඩ්පත් දරන්නා සහ ඔහුගේ/ඇයගේ උරුමකරුවන්, පැවරුම්ලත් බලකරුවන් සහ අද්මිනිස්ත්‍රාත්කරුවන් වේ. 'කාඩ්පත් ගණුදෙනු' යනු ඕනෑම වෙළඳ ව්‍යාපාරයකට භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් කරන ලද ඕනෑම ගෙවීමක් හෝ කාඩ්පත් අංකය භාවිතයෙන් හෝ කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් ගිණුමට හර කිරීමට බලය පවරන ලද ඕනෑම ආකාරයකින් ලබාගත් මුදල් අත්තිකාරම් වේ. 'සමීපතම පවුලේ සාමාජිකයා' යනු කාඩ්පත් හිමියාගේ සහකරු/සහකාරිය, වයස අවුරුදු 18 ට අඩු යැපෙන්නන් හෝ දෙමාපියන් වේ. 'වෙළෙන්දා' යනු කාඩ්පත පිළිගනිමින් භාණ්ඩ හා සේවා විකිණීම සඳහා බැංකුව විසින් පිළිගෙන ඇති පුද්ගලයෙක් හෝ ආයතනයක් වේ. 'ණය සීමාව' යනු බැංකුව විසින් තීරණය කොට වරින් වර ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කර ඇති කාඩ්පත් ගිණුමට අවසර ලබා දී ඇති උපරිම සමස්ත හර මුදල වේ. 'PIN අංකය' යනු කාඩ්පත් දරන්නාට රහසිගතව නිකුත් කළ රහස්‍ය අංකයක් වන පුද්ගලික හැඳුනුම් අංකය වේ. 'ගෙවීමට නියමිත දිනය' යනු ණයවර පත භාවිතය වෙනුවෙන් කාඩ්පත් දරන්නා විසින් ඔහු/ඇය බැංකුවට ගෙවීමට ඇති මුදලෙහි සම්පූර්ණ වටිනාකම හෝ යම් අවම මුදලක් බැංකුවට ගෙවිය යුතු දිනය වන අතර එය බැංකුවේ අභිමතය පරිදි තෝරා ගෙන ඇති, ප්‍රාථමික කාඩ්පත් දරන්නාට දැනුම් දී ඇති හා වෙබ් අඩවියේ පළ කර ඇති සෑම මසකම යෙදෙන නිශ්චිත දිනයක් වේ. 'HNB ATM' යනු හැටන් නැෂනල් බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය අදහස්වේ. 'වෙබ් අඩවිය' යනු බැංකුවේ නිල වෙබ් අඩවිය වන කාඩ්පත හා සම්බන්ධ සියලු පොදු දැනුම්දීම් පළ කෙරෙන www.hnb.net (හෝ කලින් කලට කාඩ්පත් දරන්නාට දැනුම් දෙනු ලබන එලෙස බැංකුව විසින් පවත්වාගෙන යන වෙනත් වෙබ් අඩවියක්) වේ.

"පුද්ගලික භාවිතය" යනු කාඩ්පත දරන්නාගේ භාවිතය, ඔහුගේ/ඇයගේ සහකරු/සහකාරියගේ, දරුවන්, සහ දෙමාපියන්ගේ භාවිතය වන අතර ඊට කාඩ්පත කිසිදු වාණිජ අරමුණක් සඳහා යොදාගැනීම ඇතුළත් නොවේ.

## 2. කාඩ්පත පරිහරණය

කාඩ්පත ලද විගස කාඩ්පත් හිමියා විසින් එය අත්සන් කළ යුතු අතර එය භාවිතා කළ යුතු වන්නේ

I. කාඩ්පත් හිමියා විසින් සිය පුද්ගලික භාවිතය සඳහා පමණි.

II. වර්තමානයේ කාඩ්පත භාවිතා කරමින් සිටින කාලය තුළ බලපැවැත්වෙන මෙම ගිවිසුමට අයත් කොන්දේසි වලට යටත්ව ය.

III. කාඩ්පතෙහි ණය සීමාව ඇතුළත් විය යුතුය. (සීමාව ඉක්මවා යන යන ණය ශේෂය බැංකුව වෙත වහාම ගෙවිය යුතුය.(ණය සීමාව ඉක්මවා ඇත්දැයි ගණනය කිරීමේදී බැංකුව විසින් කාඩ්පත් ගිණුමෙන් තවමත් හර කර නොමැති ඕනෑම ගණුදෙනුවක වටිනාකම සහ ඕනෑම අනාගත කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් තෙවන පාර්ශවයකට බැංකුව විසින් ලබා දී ඇති අවසරය සැලකිල්ලට ගත යුතුය.)

IV. කාඩ්පතෙහි එම්බෝස් කර ඇති වලංගු කාලය තුළ පමණි.

V. කාඩ්පත විදෙස් මුදල් සම්බන්ධ ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරුවක් සඳහා භාවිතා කරන අවස්ථාවකදී, එය විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලට යටත් වනු ඇති අතර එය භාවිතා කළ යුතු වන්නේ විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් බලය පවරන ලද අරමුණු සඳහා පමණි.

VI. විනිමය පාලන රෙගුලාසි පනත, මාර්ගෝපදේශය තුළ නිශ්චිතව දක්වා ඇති පරිදි කාඩ්පත් හිමියා විසින් කිසිදු ඉඩම් හෝ දේපළ මිලදී ගැනීමක්, මාසික වාරික පියවීමක්, හෝ ප්‍රාග්ධන ගිණුම් ගණුදෙනුවක් සඳහා ණයවර පත භාවිතා නොකළ යුතුය.

VII. යම්කිසි ප්‍රතිස්ථාපනයකදී/ආරවුලකදී/විමර්ශනයකදී බැංකුව විසින් කාඩ්පත අවහිර කළ බවට කරන ලද තහවුරු කිරීමකට යටත්ව බැංකුව විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත කාඩ්පත් හිමියා විසින් කාඩ්පත HNB ශාඛාවකට/කාඩ්පත් මධ්‍යස්ථානයකට භාර දිය යුතුය.

VIII. ගණුදෙණු සත්‍යාපන කටයුතු සඳහා කාඩ්පත විදේශයන් තුළ භාවිතා කිරීම පිළිබඳව කාඩ්පත් හිමියා විසින් බැංකුවට දැනුම් දීමක් සිදුකළ යුතුය.

## 3. කාඩ්පත් ගිණුම

3.1 කාඩ්පතෙහි භාවිතය වෙනුවෙන් බැංකුව විසින් දරා ඇති නීතිමය ගාස්තු, අනෙකුත් පරිපාලන වියදම්, පාඩු ආදීය ඇතුළු කාඩ්පත් හිමියා විසින් රැස්කරන ලද අනෙකුත් වගකීම් වල වටිනාකම හා සියළුම කාඩ්පත් ගණුදෙනු වල වටිනාකම බැංකුව විසින් කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

3.2 කාඩ්පත් දරන්නා විසින් විකුණුම් හෝ මුදල් අත්තිකාරම් වවුචරයක් අත්සන් කර ඇතත් නැතත් කාඩ්පත් ගිණුමට හර කර ඇති ශේෂය බැංකුව වෙත යළි පියවීමට කාඩ්පත් දරන්නා බැඳී ඇත.

3.3 කාඩ්පත් දරන්නා විසින් කිසිදු නීතිවිරෝධී හෝ නීතිමය නොවන කටයුත්තක් සඳහා කාඩ්පත භාවිතා නොකළ යුතු අතර ශ්‍රී ලංකා මහා බැංකු රෙගුලාසි හා ශ්‍රී ලංකා විනිමය පාලන රෙගුලාසි උල්ලංඝණය නොකළ යුතුය.

3.4 ප්‍රාථමික කාඩ්පත් දරන්නා විසින් සිය අයදුම්පත්‍රයේ සඳහන් කොට ඇති ලිපිනය හෝ ගෙවීම් සිදුකළ යුතු දිනට දින අවම වශයෙන් 14කට පෙර නිසි ලෙස ලිඛිතව කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම් දුන් ලිපිනයට බැංකුව විසින් මාසික ගිණුම් ප්‍රකාශයක් එවනු ඇත.

3.5 නියමිත ගෙවීම් දින හෝ ඊට පෙර කාඩ්පත් දරන්නා විසින් අවම මුදල හෝ පියවිය යුතුය. අවම මුදල යනු කාඩ්පත් දරන්නාගේ මාසික ප්‍රකාශයේ සඳහන් අගය හෝ ප්‍රකාශය අනුව නියම කර ඇති අවම අගය වේ. මාසික ප්‍රකාශයේ දිනට හිඟ ශේෂය ණය සීමාව ඉක්මවන්නේ නම්, එවැනි අවස්ථාවකදී අවම මුදල වන්නේ ණය සීමාව ඉක්මවා ගොස් ඇති අතිරික්ත මුදල සහ ගෙවීමට ඇති ශේෂයට අදාළ අවම මුදලෙහි එකතුවයි.

3.6 ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ බංකොලොත් වීමක්, මරණයක්, හෝ මෙම ගිවිසුම කඩ කිරීම පදනම් කරගත් බැංකුවේ අභිමතය පරිදි මෙම ගිවිසුමට ප්‍රකාර සියළුම සම්පූර්ණ හිඟ මුදල් වහාම ගෙවිය යුතු වේ.

3.7 බැංකුව වෙත සිදුකරනු ලබන ඕනෑම ගෙවීමක් බලාත්මක වන්නේ එය ලැබීමෙන් පසු කාඩ්පත් ගිණුමට බැර කිරීමෙන් අනතුරුවයි.

## 4. ගාස්තු සහ අයකිරීම

4.1 කාඩ්පත් දරන්නා විසින් බැංකුවේ ඒකාබද්ධ හා වාර්ෂික කාඩ්පත් ගාස්තු ගෙවීමට එකඟ වේ. එවැනි හිඟ ගාස්තු කාඩ්පත් ගිණුමට හර වන අතර ණයවර පත කල් ඉකුත් වන දිනට මසකට පෙර ලබාදුන් ලිඛිත දැනුම්දීමක් මත හැර වෙනත් අවස්ථාවකදී එම ගාස්තු ආපසු ගෙවීමක් නොකෙරේ.

4.2 කාඩ්පත් ගණුදෙනු සඳහා පොළිය අයකරනු ලබන්නේ කාඩ්පත් ගිණුමෙහි සඳහන් වන ගණුදෙනුව සිදු වූ දිනයේ පටන් සම්පූර්ණ ගෙවීම සිදුකරනු ලබන දිනය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වන අතර, එය ගණනය කරනු ලබන්නේ එම කාලපරිච්ඡේදයට අදාළ දෛනික සාමාන්‍ය ශේෂය සමඟ බැංකුව විසින් සිය වෙබ් අඩවියෙහි පළකරමින් ප්‍රාථමික කාඩ්පත් දරන්නාට දැනුම් දෙනු ලබන බැංකුවේ අභිමතය පරිදි තීන්දු කළ වාර්ෂික අනුපාතයක් ගැළපීමෙනි. (සඳහන් කර ඇති පොළී ගණනය කිරීමේ ක්‍රමවේදය හා පොළී අනුපාතය කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන ගැනුම් හා මුදල් අත්තිකාරම් ලබාගැනීම් යන ද්විත්වයටම අදාළ වේ. එසේ අයකරනු ලබන පොළිය මාසික ප්‍රකාශයේ දින කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. කාඩ්පත් දරන්නාගේ පහසුව උදෙසා වෙබ් අඩවිය තුළ මෙහි සඳහන් ගෙවිය යුතු මුදල් මත අය කෙරෙන පොළියට අදාළ නිදර්ශන සපයා ඇත.)

4.3 සඳහන් කර ඇති පොළී ගාස්තු ගෙවීම පැහැර හැරීමකින් තොරව, කාඩ්පත් දරන්නා විසින් නියමිත දිනට පෙර අවම මුදල ගෙවීමට අසමත් වුවහොත්, වෙබ් අඩවියේ පළකරනු ලබන හා වරින් වර ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කරන ලද අනුපාතයකට යටත්ව මාසික ප්‍රකාශයේ දිනට ඇති හිඟ මුදල මත ප්‍රමාද ගාස්තුවක් අය කෙරෙනු ලැබේ. (සඳහන් කර ඇති පොළී ගණනය කිරීමේ ක්‍රමවේදය හා පොළී අනුපාතය කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන ගැනුම් හා මුදල් අත්තිකාරම් ලබාගැනීම් යන ද්විත්වයටම අදාළ වේ. එසේ අයකරනු ලබන පොළිය මාසික ප්‍රකාශයේ දින කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. කාඩ්පත් දරන්නාගේ පහසුව උදෙසා වෙබ් අඩවිය තුළ මෙහි සඳහන් ගෙවිය යුතු මුදල් මත අය කෙරෙන පොළියට අදාළ නිදර්ශන සපයා ඇත.)

4.4 කාඩ්පත් දරන්නා විසින් සඳහන් කර ඇති පොළී ගාස්තු ගෙවීමට අගතියක් නොවී, ගෙවීමට නියමිත දිනට ඇති අවම මුදල ගෙවීමට අසමත් වුවහොත් වෙබ් අඩවියේ පළකරනු ලබන හා වරින් වර ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කරන ලද අනුපාතයකට යටත්ව ගිණුම් ප්‍රකාශයේ දිනට ඇති මුළු හිඟ මුදල මත ප්‍රමාද ගාස්තුවක් අය කෙරේ.

4.5 කාඩ්පත් දරන්නා හෝ වෙනත් පාර්ශවයක් විසින් නිකුත් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද චෙක්පතක් හෝ අනෙකුත් ගෙවීම් නියෝගයක් ගෙවීම සඳහා අගරු වේ නම් හෝ වෙනත් හෙතුවක් ඇත්නම්, වෙබ් අඩවියේ පළකරනු ලබන හා ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කළ අනුපාතයකට යටත්ව බැංකුව විසින් කාඩ්පත් දරන්නාගෙන් ඒ සඳහා සේවා ගාස්තුවක් අය කරගනිමින් එය කාඩ්පත් ගිණුමට හර කරනු ඇත. මෙම ගාස්තුව අය කෙරෙන්නේ බැංකුව විසින් අය කරනු ලබන තැපැල් ගාස්තු වලට අමතරව වේ.

4.6 වෙබ් අඩවියේ පළකරනු ලබන හා ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන අනුපාතයකට යටත්ව කාඩ්පත් ගිණුමට හර වන සියළුම මුදල් අත්තිකාරම් වෙනුවෙන් මුදල් අත්තිකාරම් ගාස්තුවක් අය කෙරේ. කාඩ්පත භාවිතා කරමින් සංචාරක චෙක්පත්, කෙටුම්පත් සහ විදුලි පණිවුඩ හුවමාරු සඳහා කෙරෙන සියලු ගෙවීම් මුදල් අත්තිකාරම් ලෙස සැලකෙන අතර, ඉහත ගාස්තු වලට යටත් වේ.

4.7 බිල්පත් කාලසීමාව තුළ යම් අවස්ථාවකදී ලබා දී ඇති කාඩ්පත් සීමාව ඉක්මවා ගෙවීම් සිදුකර ඇත්නම් සීමාව ඉක්මවීමේ ගාස්තුවක් අය කෙරේ. මෙම ගාස්තුව බැංකුව විසින් සිය අභිමතය පරිදි කලින් කලට තීරණය කරනු ලබන අතර ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරමින්, සිය වෙබ් අඩවියේද පළකරනු ලබයි. මෙම ණය සීමාව ඉක්මවීමේ ගාස්තුව අයකිරීමේදී, අදාළ බැංකු ගාස්තු වටිනාකමද සැලකිල්ලට ගනු ලැබේ.

4.8 සියලුම පෙට්‍රල්, ඩීසල්, ගෑස්, සහ ඉන්ධන පිරවුම්හල් වලින් ලබාගත හැකි අනෙකුත් සැපයුම් සඳහා වෙබ් අඩවියේ පළකරනු ලබන හා ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කළ අනුපාතයකට යටත්ව සේවා ගාස්තුවක් අය කෙරේ.

4.9 කාඩ්පත භෞතිකව ඉදිරිපත් කිරීමකින් තොරව සිදු කෙරෙන සියලුම කාඩ්පත් ගණුදෙනු සඳහා වෙබ් අඩවියේ පළකරනු ලබන හා ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කළ අනුපාතයකට යටත්ව සේවා ගාස්තුවක් අය කෙරේ.

4.10 විකුණුම් කෙටුම්පතක ඡායා පිටපතක් ලබා ගැනීම සඳහා ගාස්තුවක් වෙබ් අඩවියේ පළකරනු ලබන හා ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කළ අනුපාතයකට යටත්ව අය කෙරෙනු ලැබේ.

4.11 පරිපූරක කාඩ්පත් දරන්නන් හට නිකුත් කළ කාඩ්පත් හෝ ප්‍රඥප්ති, රෙගුලාසි හා නීති වලින් නියම කෙරෙන වෙනත් ක්‍රමවේදයක් හරහා හෝ කාඩ්පත භාවිතයෙන් සිදු කළ සියළු ගණුදෙනු සඳහා දැනට අදාළ වන පරිදි මුද්දර ගාස්තු, වෙනත් ව්‍යවස්ථාපිත ගාස්තු හෝ බදු අය කෙරේ.

4.12 කාඩ්පත ආදේශ කිරීම අත්‍යාවශ්‍ය වූ විට හෝ වෙනත් හේතුවක් මත කාඩ්පත ආදේශනය කරන්නේ නම්, වෙබ් අඩවියේ පළකරනු ලබන හා ප්‍රාථමික කාඩ්පත් දරන්නාව දැනුවත් කරනු ලබන, බැංකුව විසින් තීරණය කළ අනුපාතයකට යටත්ව කාඩ්පත ආදේශනය කිරීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර වේ.

## 5. පරිපූරක (SUPPLEMENTARY) කාඩ්පත්

5.1 ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ ඉල්ලීම මත බැංකුව විසින් ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ සමීපතම පවුලේ සාමාජිකයන් වෙත පරිපූරක කාඩ්පතක් නිකුත් කරනු ඇත. එම පරිපූරක කාඩ්පතෙහි භාවිතය මෙම ගිවිසුමේ අඩංගු නියමයන් හා කොන්දේසි වෙත බැඳෙන අතර ඒ හරහා පාලනය වේ. පරිපූරක කාඩ්පත් දරන්නා විසින් සිදු කරනු ලබන කාඩ්පත් ගණුදෙනු සහ මුදල් ආපසු ගැනීම් කාඩ්පත් ගිණුමට හර වන අතර පරිපූරක කාඩ්පත් දරන්නාට වෙනම ගිණුම් ප්‍රකාශයක් නිකුත් නොකෙරෙන බැවින් ප්‍රාථමික කාඩ්පත් දරන්නාට යවනු ලබන මාසික ගිණුම් ප්‍රකාශයේ එම තොරතුරු ඇතුළත් කෙරේ.

5.2 පරිපූරක කාඩ්පතට අදාළ බැංකු ගාස්තු සඳහා ප්‍රාථමික කාඩ්පත් දරන්නා හෝ පරිපූරක කාඩ්පත් දරන්නා වෙන වෙනම හෝ තනිව වගකිව යුතු වේ. මුළු ගෙවිය යුතු මුදලෙන් සම්පූර්ණ මුදලම හෝ ඉන් කොටසක් පරිපූරක කාඩ්පත් දරන්නා විසින් කළ ගණුදෙනු වලට අදාළ වුවද, ප්‍රාථමික ණයගැතියා ලෙස කාඩ්පත් ගිණුමෙහි පෙන්වන මුළු ගෙවිය යුතු මුදලටම වගකිව යුත්තේ ප්‍රාථමික කාඩ්පත් දරන්නා වන අතර ප්‍රාථමික කාඩ්පත් දරන්නා හා පරිපූරක කාඩ්පත් දරන්නා අතර ඇති සම්බන්ධය නිමා වීමක් නොතකා, ප්‍රාථමික කාඩ්පත් දරන්නා විසින් බැංකුවට ගෙවිය යුතු හිඟය නොගෙවා පවතින තුරුම ප්‍රාථමික කාඩ්පත් දරන්නා සතුව බැංකුව කෙරෙහි ඇති වගකීමද එලෙසම පවතී.

5.3 පරිපූරක කාඩ්පතක් නිකුත් කළ පසු ප්‍රාථමික කාඩ්පත් දරන්නා හෝ පරිපූරක කාඩ්පත් දරන්නා විසින් කාඩ්පත් මධ්‍යස්ථානයට කෙරෙන ලිඛිත දැනුම් දීමක් මත එය අවලංගු කෙරෙන තුරුම කාඩ්පත බලාත්මකව පවතී.

5.4 මෙම ගිවිසුම අවලංගු කොට ප්‍රාථමික කාඩ්පත භාවිතා කිරීමද අවසන් වන අවස්ථාවකදී සියලුම පරිපූරක කාඩ්පත් හිද භාවිතය භාවිතය අවසන් වන අතර පරිපූරක කාඩ්පත් සියල්ල නැවත වහාම බැංකුව වෙත භාර දිය යුතුය.

## 6. බිල්පත් සහ ගෙවීම්

6.1 ගෙවීමට නියමිත දිනය නියම කරගැනීමේ හා පොළිය ගණනය කිරීම් කටයුතු සඳහා බැංකුව විසින් ප්‍රාථමික කාඩ්පත් දරන්නා වෙත බිල්පත් කාලසීමාව අවසානයේදී (බැංකුවේ අභිමතය පරිදි තීරණය කරන ලද, සෑම මසකම නිශ්චිත දිනකදී) මාසික ගිණුම් ප්‍රකාශයක් යවනු ලැබේ. මෙම මාසික ගිණුම් ප්‍රකාශයේ ප්‍රාථමික/පරිපූරක කාඩ්පත් දරන්නා විසින් බිල්පත් කාලසීමාව ඇතුළතදී සිදු කර ඇති කාඩ්පත් ගණුදෙනු, පෙර ගිණුම් ප්‍රකාශයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය, බිල්පත් කාලසීමාව තුළදී කාඩ්පත් මධ්‍යස්ථානය විසින් ලද ගෙවීම්, බිල්පත් කාලසීමාව අවසානයේදී කාඩ්පත් ගිණුමේ පවතින මුළු හිඟ මුදල, කාඩ්පත් හිමියා විසින් මුළු හිඟයෙන් ගෙවිය යුතු දිනට පියවිය යුතු අවම මුදල යන දෑ අන්තර්ගත වේ.

6.2 කිසියම් අවස්ථාවකදී, ප්‍රාථමික කාඩ්පත් දරන්නා හට සිය මාසික ගිණුම් ප්‍රකාශය නොලැබුණහොත්, ඔහු/ඇය හට මාසික ගිණුම් ප්‍රකාශය නොලැබුණු මාසයේ බිල්පත් කාලසීමාව අවසන් වී දින 10ක් ඇතුළත ඒ පිළිබඳව කාඩ්පත් මධ්‍යස්ථානය දැනුවත් කිරීමට ප්‍රාථමික කාඩ්පත් දරන්නා වගබලා ගත යුතුයි.

6.3 බැංකුවේ ගණුදෙනුකරුවෙකු වන කාඩ්පත් දරන්නා හට සිය කාඩ්පත් ගණුදෙනු, ගිණුම් තත්ත්වය, පරීක්ෂා කිරීමට හා බිල්පත් ගෙවීන් සිදු කිරීමට e-banking / virtual banking සේවාවන් ක්‍රියාත්මක කළ හැකියි.

6.4 මාසික ගිණුම් ප්‍රකාශය නොලැබීම, ඔහු/ඇයට නියමිත දිනට බැංකුවට ගෙවිය යුතු ගෙවීම් සිදු කිරීමට ඇති වගකීමෙන් කාඩ්පත් දරන්නාව නිදහස් නොකරයි.

6.5 කාඩ්පත් ගිණුමට අදාළව කාඩ්පත් දරන්නා විසින් බැංකුවට කරනු ලබන ගෙවීම්, කාඩ්පත් මධ්‍යස්ථානය විසින් ලද වහාම මෙම කොන්දේසි හා නියමයන්ට යටත්ව බැංකුව තීරණය කරනු ලබන පිළිවෙලට අනුව කාඩ්පත් දරන්නා සතුව බැංකුව කෙරෙහි ඇති වගකීම් කපහැරීම වෙනුවෙන් යොදාගනී.

6.6 බැංකුවේ ඕනෑම ශාඛාවක ඉතුරුකිරීමේ හෝ ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන කාඩ්පත් දරන්නාට එම ගිණුම හරහා නියමිත ගෙවීම් දිනට පෙර එවැනි ගණුදෙනුවක වටිනාකම පියවීමට සෘජු හර ස්ථාවර නියෝගයක් නිකුත් කළ හැකියි. එවැනි සෘජු හර ස්ථාවර නියෝගයක සංශෝධනයක් හෝ අවලංගු කිරීමක් වේ නම් මීළඟ ගෙවීම් දිනට සති දෙකකට පෙර එම ස්ථාවර නියෝගය කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලැබිය යුතුය.

6.7 කාඩ්පත් දරන්නා විසින් කාඩ්පත් ගිණුමට නිකුත් කරන ලද සෑම මාසික ගිණුම් ප්‍රකාශයක්ම පරික්ෂා කළ යුතු අතර කිසියම් දෝෂයක් වේ නම් ගිණුම් ප්‍රකාශයේ දින සිට දින 14 ක් ඇතුළතදී බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය දැනුවත් කළ යුතුයි. කාඩ්පත් දරන්නා එසේ දින 14 ක් ඇතුළත එවැනි දෝෂයක් පිළිබඳව බැංකුව දැනුවත් කිසිම 6.8 නොසලකා හැර ඇත්නම් හෝ දැනුවත් කිරීමට අපොහොසත් වී ඇත්නම්, ගිණුම් ප්‍රකාශය සහ එහි සියළු සටහන් කාඩ්පත් දරන්නාට බැඳෙන අතර එය එහි අන්තර්ගතය පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් සේ සැලකෙන බැවින් එහි අන්තර්ගතය පිළිබඳව ඉන් පසු කාඩ්පත් දරන්නා සිය විරුද්ධ නොවිය යුතුයි. සියළුම ගිණුම් ප්‍රකාශ සාමාන්‍ය තැපෑල හරහා ප්‍රාථමික කාඩ්පත් දරන්නා විසින් බැංකුවට ලිඛිතව දැනුම් දී ඇති නවතම ලිපිනය යවනු ලබන අතර තැපැල් කිරීමෙන් පැය 48 ක් ඇතුළත කාඩ්පත් දරන්නා වෙත ලැබී ඇති බවට සැලකේ. 011 2 462 462 යන දුරකතන අංකය, 011 2 686 713 යන ෆැක්ස් අංකය, hnbcare@hnb.lk යන ඊමේල් ලිපිනය හෝ බැංකුව විසින් කලින් කලට නම් කර සිය වෙබ් අඩවියේ පළ කර ඇති ඕනෑම දුරකතන අංකයක්/ සම්බන්ධතා මාදිලියක් හරහා කාඩ්පත් දරන්නාට කාඩ්පත් ගිණුමට අදාළ ඕනෑම පැමිණිල්ලක් කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළ හැකියි.

6.8 අවස්ථානුකූලව විදේශ මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට හෝ ශ්‍රී ලංකා රුපියල් විදේශ මුදල් වලට නැවත හුවමාරු කිරීමේදී කාඩ්පත් දරන්නා විසින් ඕනෑම අවස්ථාවක, ඔහු/ඇය හා බැංකුව අතර තීරණය කරන ලද හෝ යෙදී ඇති පරිදි අදාළ හුවමාරු හෝ නැවත හුවමාරු කිරීමේ අනුපාතයන් අවසාන හා තීරණය කරන ලද ඒවා බවට පිළිගත යුතු වේ. ගෙවීම් සිදු කරන මුදල් වර්ගය සහ ගිණුමේ ඇති මුදල් ඒකකය කුමක් වුවත්, කාඩ්පත් දරන්නා සතුව බැංකුව කෙරෙහි ඇති අවසාන වගකීම පවතින්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

6.9 සියලු පරිවර්තන සහ ප්‍රති-පරිවර්තන බැංකුවට කිසිදු විනිමය පාඩුවක් සිදු නොවන සේ සිදු විය යුතු අතර, එවැනි විනිමය පාඩුවක් සිදු වුවහොත් ඒ වෙනුවෙන් බැංකුවට වන්දි මුදලක් ගෙවීමට කාඩ්පත් දරන්නා වගකීම බාර ගත යුතු වේ. විනිමය අලාභය යන්නෙන් අදහස් වන්නේ බැංකුවට, එහි නියෝජිතයාට හෝ වාර්තාකරුවන්ට මුදල් ඒකකවල සමානාත්මතාවයේ යම් උච්චාවචනයන් හෝ ඕනෑම මුදල් ඒකකයක්/ඒකකයන් අවප්‍රමාණය වීම හේතුවෙන් අත්විඳින්නට සිදු වන අලාභයයි.

6.10 කාඩ්පත් දරන්නා විසින් මෙහිදී, සිය මරණයෙන් පසු බලකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, නීතිමය නියෝජිතයන් හෝ කාඩ්පත් දරන්නාගේ උරුමය ලැබූ ළඟම ඥාතියා විසින් සිය කාඩ්පත් ගිණුමේ පවතින සියලු ගෙවීමට ඇති හිඟ මුදල් පියවීමට බැඳී සිටින බවට එකඟ වේ.

## 7. ගිණුම් ප්‍රකාශය

7.1 නිසි පරිදි සම්පූර්ණ කරන ලද, කාඩ්පත මත එම්බොස් කර ඇති තොරතුරු වල ප්‍රතිනිර්මාණයක් හෝ මුද්‍රාවක් සහිත ඕනෑම විකුණුම් කෙටුම්පතක් සහ/හෝ වෙනත් අයකිරීමක්, ඉලෙක්ට්‍රොනික විකුණුම් යන්ත්‍රයක් මඟින් නිපදවූ ඕනෑම ඉන්වොයිසයක්/මුද්‍රණයක් කාඩ්පත් දරන්නා විසින් බැංකුවට ගෙවිය යුතු මුදලක තීරණාත්මක සාක්ෂියක් සේ බැංකුව විසින් සලකනු ලබන බවට, කාඩ්පත් දරන්නා විසින් මෙහිදී එකඟ වේ.

7.2 කාඩ්පත් මධ්‍යස්ථානයේ කළමනාකරු විසින් හෝ ඒ සඳහා බැංකුව විසින් නිශ්චිතව පත් කර ඇති වෙනත් පුද්ගලයෙකු විසින් අත්සන් කොට සහතික කළ, ලිඛිත හෝ ලේඛනගත කළ ආකෘතියකින් බැංකුව විසින් කාඩ්පත් දරන්නා වෙත ඉදිරිපත් කර ඇති ඕනෑම ගිණුම් ප්‍රකාශයක්, එය තහවුරු කිරීමට වෙනත් කිසිදු ලේඛනයක් හෝ වවුචරයක් නොමැතිව අවස්ථාවක වුවද කාඩ්පත් දරන්නාට එරෙහිව තීරණාත්මක සාක්ෂියක් සේ නීතිය ඉරිදියේදී සැලකීමට ප්‍රමාණවත් බවට කාඩ්පත් දරන්නා විසින් මෙහිදී එකඟ වේ. මෙම ගිණුම් ප්‍රකාශය  කාඩ්පත් ගණුදෙනු, ගාස්තු, ව්‍යවස්ථාපිත ගෙවීම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කළ මුදල් ආපසු ගැනීම් හෝ පොත් ආශ්‍රයෙන් පිළියෙළ කළ ප්‍රකාශ, බැංකුවේ පරිගණක වාර්තා, ලේඛන හා මතක ගබඩා යනාදිය පෙන්නුම් කරන ලේඛන ස්වරූපයෙන්ද පැවතිය හැකි බවටද කාඩ්පත් දරන්නා මෙහිදී එකඟ වේ. බැංකුව විසින් ඉදිරිපත් කරනු ලබන එවැනි ලේඛනයක් කඩ්පට්ත් දරන්නා විසින් බැංකුවට පියවිය යුතු හිඟ මුදලකට තීරණාත්මක සාක්ෂියක් ලෙස අධිකරණය ඉදිරියේදී පිළිගත හැකි බවටද කද්පාත් දරන්නා විසින් මෙහිදී තවදුරටත් එකඟ වේ.

7.3 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනතෙහි විධිවිධාන මඟින් අර්ථ දක්වා ඇති පරිදි විකුණුම් යන්ත්‍ර,මාර්ගගත ගණුදෙනු, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මඟින් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා සිදු කළ මුදල් ආපසු ගැනීම් පෙන්වමින් ඉහත උප-ඡේදය (2) හි සඳහන් කර ඇති, ඕනෑම ගිණුම් ප්‍රකාශයක, උපුටගැනීමක, ලියවිල්ලක හෝ වෙනත් ලේඛනයක අන්තර්ගත ඕනෑම තොරතුරක් වලංගුභාවයකින් යුත් බවට කාඩ්පත් දරන්නා විසින් මෙහිදී එකඟ වේ.

## 8. PIN අංකය සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතය

8.1 ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් භාවිතයෙන් මුදල් ආපසු ගැනීමට පහසුමක් සලසමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුමකම කාඩ්පත හා සම්බන්ධ කර තිබෙන අවස්ථාවක එම පහසුකම භාවිතය, විනිමය පාලන පනතේ විධිවිධාන අනුව ඉලෙක්ට්‍රොනික යන්ත්‍ර මඟින් කාඩ්පත් භාවිතා කිරීම පාලනය කරනු ලබන බැංකුව හා වීසා/මාස්ටර් කාඩ් අතර ඇති ජාත්‍යන්තර ගිවිසුමට යටත් වේ.

## 9. කාඩ්පත සහ PIN අංකය ආරක්ෂා කිරීම

9.1 කාඩ්පතේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කාඩ්පත් හිමියා හැකි සෑම සැලකිල්ලක්ම දැක්විය යුතු අතර PIN අංකය වෙනත් පුද්ගලයෙකුට දැනගැනීමෙන් වැළැක්විය යුතු වේ. PIN අංකය කිසිදු අයුරකින් ලියා තබාගෙන නැති බවටද තහවුරු කර ගත යුතු වේ.

## 10. කාඩ්පත නැතිවීම සහ එහි වගකීම

10. 1 කාඩ්පත අස්ථානගත වී ඇත්නම් / සොරකම් කර ඇත්නම් / විනාශ වී ඇත්නම් / අනිසි ලෙස භාවිතා කිරීමට වගකිව යුතු නම් හෝ PIN අංකය තවත් පුද්ගලයෙකුට අනාවරණය වී ඇත්නම් කාඩ්පත් දරන්නා එම අස්ථානගත වීම/ සොරකම/ හෙළිදරව් වීම පිළිබඳව පොලිසියට සහ කාඩ්පත් මධ්‍යස්ථානයට වහාම දැනුම් දිය යුතුය. එවැනි දැනුම් දීමක් කාඩ්පත් මධ්‍යස්ථානය වෙත වාචිකව ඉදිරිපත් කර ඇත්නම්, එය ලිඛිතව කාඩ්පත් මධ්‍යස්ථානය වෙත තහවුරු කරන තුරු බලාත්මක නොවේ.

10.2 එවැනි ලිඛිත දැනුම් දීමක් කාඩ්පත් මධ්‍යස්ථානයට ලැබෙන තුරු මෙම ගිවිසුමේ දක්වා ඇති ආකාරයට එවැනි සියළු මුදල් කාඩ්පත් දරන්නාගෙන් අයකරගනු ලැබේ.

10.3 කාඩ්පත නැතිවීම හෝ අනිසි ලෙස භාවිතා කිරීම හෝ PIN අංකය හෙළිදරව් කිරීමේ තත්වයන් හමුවේ අස්ථානගත වූ කාඩ්පතක් නැවත ලබා ගැනීමට සහය වීමට බැංකුව විසින් අවශ්‍ය යැයි සැලකෙන සියලුම පියවර ගැනීමට අවස්ථාව සලසමින් කාඩ්පත් දරන්නා විසින් කාඩ්පත් දරන්නා සතුව ඇති සියලුම තොරතුරු බැංකුව වෙත ලබා දිය යුතුය. කාඩ්පත් දරන්නා විසින් පොලීසියට සිදු කළ ප්‍රකාශයේ සහතික කළ පිටපතක්ද බැංකුව වෙත ලබා දිය යුතුය.

10.4 බැංකුවේ පරම අභිමතය පරිදි, අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද ඕනෑම කාඩ්පතක් සඳහා මුල් කාඩ්පතට සමාන නියමයන් සහ කොන්දේසි මත, ගාස්තුවකට යටත්ව ආදේශක කාඩ්පතක් නිකුත් කරනු ඇත.

10.5 කාඩ්පත් දරන්නා යම් අවස්ථාවකදී අස්ථානගත වූ හෝ සොරාගත් කාඩ්පත නැවත ලබාගැනීමට සමත් වුවහොත් එවැනි අවස්ථාවකදී කාඩ්පත් දරන්නා විසින් කඩ්පත වහාම කාඩ්පත් මධ්‍යස්ථානය වෙත නැවත බාරදිය යුතුයි.

## 11. නිදහස් කිරීම සහ බැහැර කිරීම

11.1 වෙළඳ ආයතනයක්, වෙනත් ඕනෑම බැංකුවක් හෝ වෙනත් පාර්ශවයක් කාඩ්පතට ගරු කිරීමට, කාඩ්පත පිළිගැනීමට, මුදල් අත්තිකාරම් ඇතුළු ණය පහසුකම් සම්පූර්ණ බලයලත් කාඩ්පත් සීමාව දක්වා දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කරයි නම් එයින් සිදු වන හා අත්විඳින අලාභයට හා හානියට බැංකුව විසින් වග නොකියන බවට කාඩ්පත් දරන්නා එකඟ වේ.

11.2 කාඩ්පත හරහා ගෙවීම් සිදු කරමින් මිලදී ගත් භාණ්ඩවල හෝ සපයනු ලබන සේවාවන්හි යම් දෝෂයක් සඳහා බැංකුව වගකියන්නේ නැත. ආයතනයක්, වෙළඳ ව්‍යාපාරයක්, කෝ වෙනත් ඕනෑම බැංකුවක් සමඟ ඇති වන හිමිකම් ඉල්ලා සිටීමක් හෝ ආරවුලක් වන්නේ නම්, බැංකුව මඟින් කිසිදු ගෙවීමක් සිදු නොකර කාඩ්පත් දරන්නා හා එම ආයතනය, වෙළඳ ව්‍යාපාරය හෝ එම බැංකුව අතර එය විසඳාගත යුතුය. හෝ

11.3 කිසියම් යන්ත්‍රයක, දත්ත සැකසුම් පද්ධතියක, ඉලෙක්ට්‍රොනික සම්ප්‍රේෂණ පද්ධතියක හෝ සම්ප්‍රේෂණ සබැඳියක දෝෂයක් හේතුවෙන්, කාර්මික ආරවුලක් හෝ බැංකුවේ සහ එහි සේවකයන්ගේ පාලනයෙන් ඔබ්බට ගිය ඕනෑම හේතුවක් නිසා මෙම ගිවිසුම යටතේ බැංකුව සිය වගකීම ඉටු කිරීමට අපොහොසත් වුවහොත් කාඩ්පත් දරන්නා එහි වගකීම බැංකුව වෙත නොපැවරිය යුතුය.

## 12. අයකරගැනීම

12.1 නියමිත ගෙවීන් දිනට පෙර මෙම නියමයන් හා කොන්දේසි වලට යටත්ව ඔහුගේ/ඇයගේ වගකීම් බැංකුවට පියවීමට කාඩ්පත් දරන්නා අපොහොසත් වුවහොත් කාඩ්පත් දරන්නාගේ මුළු හිඟ මුදල, බැංකුවේ ඕනෑම ශාඛාවක ඔහු/ඇය තනිව හෝ වෙනත් අයෙකු සමඟ ඒකාබද්ධව පවත්වාගෙන යනු ලබන ජංගම, ඉතුරුකිරීමේ හෝ වෙනත් වර්ගයක ගිණුමකට ඕනෑම මොහොතකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව හර කිරීමට බැංකුවට අයිතියක් ඇති බවට කාඩ්පත් දරන්නා නිශ්චිතව එකඟ වේ.

12.2 (1) කාඩ්පත් ගිණුමෙහි කාඩ්පත් දරන්නා විසින් බැංකුවට වගකියන මුදල් ප්‍රමාණය මුදා හරිමින් බැංකුවේ ඕනෑම ශාඛාවක කාඩ්පත් හිමියා විසින් පවත්වාගෙන යනු ලබන එවැනි ඕනෑම ගිණුමක ඇති ශේෂය කපා හැරීමට (2) බැංකුවේ ඕනෑම ශාඛාවක පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමක කාඩ්පත් දරන්නා විසින් බැර කර ඇති ඕනෑම මුදලකින් කාඩ්පත් දරන්නා විසින් ගෙවිය යුතුව පවතින සම්පූර්ණ හිඟ මුදල දක්වා මුදලක් අය කරගැනීමට (3) කාඩ්පත් දරන්නා විසින් තනිව හෝ ඒකාබද්ධව බැංකුවේ ඕනෑම ශාඛාවක පවත්වාගෙන යනු ලබන ඕනෑම තැන්පතුවක් නිදහස් කරගනිමින් කාඩ්පත් ගිණුමෙහි හිඟ මුදල පියවාගැනීමට හෝ කාඩ්පත් ගිණුමෙහි හිඟ මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තුරු එම තැන්පතු බැංකුවේ අයිතියට පවරාගැනීමට, ඔහුට කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව කටයුතු කිරීම සඳහා මෙහිදී කාඩ්පත් දරන්නා නැවත අවලංගු කළ නොහැකි ලෙස සිය බලය පවරයි.

12.3 කාඩ්පත් දරන්නාගේ කාඩ්පත් ගිණුම හරහා බැංකුවට ගෙවීමට ඇති හිඟ මුදල පියවීම සඳහා, කාඩ්පත් දරන්නාගේ වත්කම් භාවිතයෙන් ඕනෑම මුදලක් අයකර ගැනීමට බැංකුවට හිමිකම් ඇති බව කාඩ්පත් හිමියා පිළිගෙන එකඟ වන අතර බැංකුව විසින් ගනු ලබන එවැනි පියවර වෙනුවෙන් බැංකුවට වන්දි ගෙවීමට කාඩ්පත් දරන්නා එකඟ වේ.

12.4 මෙම නියමයන් කොන්දේසි යටතේ බැංකුව වෙත ඇති ඔහු/ඇය සතුව ඇති වගකීම් පියවීමට කාඩ්පත් දරන්නා අපොහොසත් නම්, බැංකුව එහි පරම අභිමතය පරිදි මෙම ගිවිසුම ඒකපාර්ශ්විකව අවසන් කළ හැකි අතර මෙම ගිවිසුම යටතේ කාඩ්පත් දරන්නා වෙත නිකුත් කරන ලද සියලුම කාඩ්පත් (පරිපූරක කාඩ්පත්ද ඇතුළුව) අවලංගු කිරීමටද හැකියාව ඇත. කාඩ්පත් දරන්නාගේ පැහැරහැරීමක් හේතුවෙන් බැංකුව විසින් මෙම ගිවිසුම අවලංගු කරන්නේ නම්, එවැනි කාඩ්පත් හිමියෙකු බැංකුව සමඟ නව කාඩ්පත් ගිවිසුමකට එළඹීමට සුදුසුකම් නොලබන අතර බැංකුව කාඩ්පත් දරන්නා (ප්‍රාථමික හා පරිපූරක කාඩ්පත් දරන්නන් සියල්ලම) පිළිබඳව ශ්‍රී ලංකා තොරතුරු කාර්යාංශයට වාර්තා කරනු ඇත.

12.5 මෙම නියමයන් හා කොන්දේසි යටතේ බැංකුව වෙත ඇති ඔහුගේ/ඇයගේ වගකීම් පියවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වූයේ නම්, ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් හා එක්රැස් කිරීමේ නියෝජිතයන් වැනි තුන්වන පාර්ශවයක සේවාව ලබාගනිමින් කාඩ්පත් දරන්නා හමුවට ගොස්, කාඩ්පත් දරන්නා විසින් සිය කාඩ්පත් ගිණුම හරහා බැංකුවට ගෙවීමට ඇති හිඟ මුදල පියවීමට ඔහු/ඇයව පෙළඹවීම හා එවැනි අවස්ථාවකදී තුන්වන පාර්ශවයට, ස්වාධීන කොන්ත්‍රාත්කරුවන්ට ගිණුදෙනු සහ හිඟ මුදල වැනි අවශ්‍ය ණය තොරතුරු හෙළි කිරීමටද කාඩ්පත් දරන්නා විසින් බලය පවරයි.

12.6 එවැනි අවස්ථාවකදී කාඩ්පත් ගිණුමෙන් ගෙවිය යුතු හිඟ මුදල ගෙවීමට කාඩ්පත් දරන්නා පැහැර හරින්නේ නම් කාඩ්පත් ගිණුම හරහා හිඟව පවතින මුදල අය කරගැනීම සඳහා ප්‍රාථමික කාඩ්පත් දරන්නාට (පරිපූරක කාඩ්පත් දරන්නෙකු සිටි නම් පරිපූරක කාඩ්පත් දරන්නා සමඟ ඒකාබද්ධව හෝ වෙන වෙනම) එරෙහිව අවශ්‍ය නීතිමය පියවර ලබාගැනීමට බැංකුවට අයිතිය ඇති බවට කාඩ්පත් දරන්නා විසින් පිළිගනී.

12.7 ගෙවීම බලාත්මක කිරීම සඳහා එය ණය එක්රැස් කිරීමේ නියෝජිත ආයතයකට බාරදීමට සිදු වුවහොත්, නීතිමය උපදෙස් ලබාගැනීමට සිදු වුවහොත් ඒ සඳහා දැරීමට සිදු වන සියලුම ණය එක්රැස් කිරීමේ වියදම්, නීතිමය වියදම්, හා පොළිය සමඟ හිඟ මුදල ගෙවීමට ඔහු/ඇය වගකියන බවට කාඩ්පත් දරන්නා විසින් පිළිගනී.

## 13. හෙළිදරව් කිරීම

13.1 එවැනි සේවාවන් සැපයීමේ සීමිත අරමුණු සඳහා, බැංකුව විසින් අභියුක්ත කර ඇති තෙවන පාර්ශවීය සේවා සපයන්නෙකුට කාඩ්පත් දරන්නාගේ කාඩ්පත් ගිණුමට සම්බන්ධ තොරතුරු කාඩ්පත් දරන්නාට කෙරෙන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව හෙළි කිරීමට බැංකුවට හැකියාව ඇති අතර කාඩ්පත් දරන්නා විසින් කාඩ්පත් ගිණුම හරහා ගෙවිය යුතු හිඟ මුදල ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී එම ණය තොරතුරු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශයට හෙළි කිරීමටද බැංකුව සතුව හැකියාවක් ඇත.

## 14. සාමාන්‍ය කරුණු

14.1 ඔහුගේ/ඇයගේ නම, ලිපිනය, රැකියාව සහ ජංගම දුරකථන අංකය ආදිය වෙනස් කිරීමක් ඇත්තේ නම්, ප්‍රාථමික කාඩ්පත් හිමියා විසින් වහාම බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට ඒ සම්බන්ධව ලිඛිතව දැනුම් දිය යුතුය.

14.2 බැංකුවේ පරම අභිමතය පරිදි කාඩ්පත් දරන්නාගේ හිඟ මුදල සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් මාරු කිරීමට, පැවරීමට හෝ විකිණීමට බැංකුව සතුව හැකියාවක් ඇත.

14.3 ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ ලිඛිත ඉල්ලීම අනුව බැංකුවේ අභිමතය පරිදි, ඔහුගේ/ඇයගේ ණයවර පත upgrade කිරීමට හෝ ඔහුගේ/ඇයගේ ණය සීමාව ඉහළ නැංවීමට බැංකුව සතුව හැකියාවක් ඇත.

14.4 බැංකුවට අවශ්‍ය අවස්ථාවන්හිදී කාඩ්පත් දරන්නා විසින් සිය මූල්‍යමය තත්ත්වය පිළිබඳ තොරතුරු බැංකුවට ලබා දිය යුතුය. ඊට අමතරව ලබා දුන් තොරතුරු තහවුරු කරගැනීම සඳහා කාඩ්පත් දරන්නා විසින් බැංකුවට බලය පවරයි. ඉල්ලා සිටින අවස්ථාවේදී තොරතුරු ලබා නොදුන්නේ නම්, සිය අභිමතය පරිදි කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමටත්, වහාම කාඩ්පත අවලංගු කිරීමටත් බැංකුවට හැකියාව ඇත.

## 15. කාඩ්පත අවලංගු කිරීම

15.1 කාඩ්පත සැමවිටම බැංකුවේ දේපළක් ලෙස පවතින අතර බැංකුව ඉල්ලා සිටින අවස්ථාවකදී කාඩ්පත් දරන්නා විසින් එය නැවත බැංකුවට බාරදිය යුතුව තිබේ. පූර්ව දැනුම් දීමකින් තොරව මෙම ගිවිසුම යටතේ ඇති, අඛණ්ඩව බලාත්මකව පවතින කාඩ්පත් දරන්නාගේ වගකීම් වලට බලපෑමක් නොවන පරිදි කාඩ්පත භාවිතා කිරීමේ අයිතිය සම්පූර්ණයෙන්ම හෝ නිශ්චිත පහසුකම් සම්බන්ධයෙන් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට, නැවත නිකුත් කිරීම, අලුත් කිරීම, වෙනත් ආදේශක කාඩ්පතක් ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට හැකියාව ඇත.

## 16. ගිවිසුම අහෝසි කිරීම

16.1 කාඩ්පත් මධ්‍යස්ථානයට කෙරෙන ලිඛිත දැනුම් දීමක් මත මෙම ගිවිසුම අවසන් කිරීමට ප්‍රාථමික කාඩ්පත් දරන්නා සතුව හැකියාවක් ඇති නමුත් එය ක්‍රියාත්මක වන්නේ බැංකුව විසින් කාඩ්පත් ගිණුම හරහා නිකුත් කර ඇති සියලුම කාඩ්පත් නැවත බැංකුවට ලබා දීමෙන් හා මෙම ගිවිසුම ප්‍රකාරව කාඩ්පත් දරන්නා සතුව ඇති සියළුම වගකීම් පියවීමෙන් අනතුරුවයි.

16.2 කාඩ්පත් දරන්නා රට හැර යන අවස්ථාවකදී කාඩ්පත (පරිපූරක කාඩ්පත් ද ඇතුළුව) බැංකුවට බාරදිය යුතු වේ.

16.3 කාඩ්පත් දරන්නා විදෙස් රැකියාවක් සඳහා රට හැර යන අවස්ථාවකදී, කාඩ්පත් දරන්නා හට ශ්‍රී ලංකාවේ විනිමය පාලන පනතේ රෙගුලාසි වලට යටත්ව කාඩ්පත භාවිතා කළ හැක.

16.4 කාඩ්පත් දරන්නා ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු නොවන අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ විනිමය පාලන පනතේ එන අර්ථ දැක්වීම අනුව යමින් කාඩ්පත (පරිපූරක කාඩ්පත් ද ඇතුළුව) අවලංගු කිරීමේ හැකියාව බැංකුව සතුව ඇත.

16.5 මෙම ගිවිසුමේ දැක්වෙන ඕනෑම කරුණක් මත පදනම්ව ගිවිසුම අවසන් කිරීමටත්, කාඩ්පත් පහසුමක් අවලංගු කිරීමටත් බැංකුව සත්තුව හැකියාවක් ඇත.

## 17. මෙම ගිවිසුම වෙනස්කිරීම

17.1 වෙනත් කාඩ්පත් දරන්නෙකු සමඟ සමාන වෙනස්කමක්/ සංශෝධනයක් සිදු කළත් නැතත්, මෙම ගිවිසුම ඕනෑම අවස්ථාවකදී ඕනෑම වාර ගණනක් සංශෝධනය කිරීමට බැංකුවට හැකියාවක් ඇත. එවැනි සෑම වෙනස්කිරීමක්/සංශෝධනයක්ම කාඩ්පත් දරන්නාට දැනුම් දෙන අතර බැංකු වෙබ් අඩවියේද පළ කෙරේ. එවැනි වෙනස්කිරීමකට/ සංශෝධනයකට කාඩ්පත් දරන්නා එකඟ නොවන්නේ නම් ඉහත සඳහන් ආකාරයට මෙම ගිවිසුම අවසන් කිරීමට ඔහුට/ඇයට නිදහස ඇති අතර, වෙනස්කිරීම/ සංශෝධනය දැනුම් දුන් දින පටන් දින 10 ක් ඇතුළතදී ඒ පිළිබඳව දැනුම් දිය යුතු වේ.

## 18. වන්දිපූර්ණය (INDEMNITY)

18.1 උපදෙස් ලැබෙන අවස්ථාවේ පවතින තත්ත්වයන් නොසලකා කාඩ්පත් දරන්නා හෝ ඔහු වෙනුවෙන් වෙනත් අයෙක් විසින් ලබා දී ඇති කිසියම් දැනුම් දීමක්, ඉල්ලීමක් හෝ දුරකථන, ටෙලෙක්ස් මාර්ගයෙන්, හෝ රූපාකාරයෙන් කරන ලද සන්නිවේදනයක් අනුව යමින් යහපත් අරමුණින් ක්‍රියාත්මක වන උපදෙස් සඳහා බැංකුවට වන්දිපූරණය කිරීමට කාඩ්පත් දරන්නා මෙයින් එකඟ වේ.

18.2 මෙහි ඇති ප්‍රතිපාදන හේතු කොටගෙන හෝ ඒවා බලාත්මක කිරීම හේතු කොටගෙන බැංකුවට දරන්නට සිදු වන වගකීම්, අලාභ, හානි, පිරිවැය, හා වියදම් (නීතිමය හෝ නොවන) සඳහා වන්දිපූර්ණය කිරීමට කාඩ්පත් දරන්නා බැඳී සිටියි.

## 19. සුරැකුම්පත් රඳවා තබා ගැනීම

19.1 කාඩ්පත් දරන්නා සිය වගකීම් පැහැර හරින්නේ නම්, වෙනත් ඕනෑම මූල්‍ය පහසුකමක් සහ/හෝ උකස් ඇතුළුව බැංකුව විසින් ලබා දෙන සේවාවන් ආපසු ගෙවීම සුරක්ෂිත කිරීම වෙනුවෙන් ණයවර පත් පහසුකම/ පහසුකම් යටතේ බැංකුවට ගෙවිය යුතු මුළු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තෙක් ඔහු විසින් පවත්වාගෙන ගිය සුරැකුම්පත් රඳවා තබා ගැනීමට බැංකුවට අයිතියක් ඇත.

## 20. දැනුම්දීම්

20.1 ප්‍රාථමික කාඩ්පත් දරන්නා වෙත කෙරෙන සියළු දැනුම්දීම් ඔහු/ඇය විසින් ලිඛිතව බැංකුවට ලබා දී ඇති ප්‍රාථමික කාඩ්පත් දරන්නාගේ නවතම ලිපිනයට තැපැල් මාර්ගයෙන් යොමු කෙරෙන අතර තැපෑලට ඇතුළත් කිරීමෙන් පැය 48 ක් ඇතුළතදී කාඩ්පත් දරන්නාට එය ලැබුණු බවට සැලකේ. ඊට අමතරව, සියළුම පොදු දැනුම්දීම් වෙබ් අඩවිය තුළ පළකෙරෙනු ඇත.

## 21. පාලන නීතිය

21.1 මෙම ගිවිසුම පාලනය වන්නේ සහ අර්ථකථනය වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති වලට අනුකූලවයි.

## 22. නීතිවිරෝධී ක්‍රියා

22.1 කිසියම් කාඩ්පත් දරන්නෙකු විසින් කිසියම් ආකාරයකට ඕනෑම අරමුණක් වෙනුවෙන් ශ්‍රී ලංකා නිතිය උල්ලංඝනය වන අයුරින් කාඩ්පත භාවිතා කරන්නේ නම් එය ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වරදක් ලෙස සැලකේ. එවැනි අවස්ථාවකදී සිය පරම අභිමතය පරිදි, වහාම ක්‍රියාත්මක වන පරිදි ඒකපාර්ශවිකව මෙම ගිවිසුම අවසන් කිරීමටත් කාඩ්පත් දරන්නා හට නිකුත් කර ඇති සියළුම කාඩ්පත් අවලංගු කරන්නටත් බැංකුවට හැකියාවක් ඇත. එවැනි නීතිවිරෝධී ක්‍රියා/ගණුදෙනු සම්බන්ධයෙන් වූ තොරතුරු බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කළ යුතුය.